# දෙවනගල රජමහ විහාර ගිරිතලයේ සටහන් කර ඇති අල්ප උන්නත කැටයම් ඵලකය පිළිබඳ අර්ථ විග්‍රහයක්

දමිත් රණගල[1]

කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් මාවනැල්ල නගරයේ සිට හෙම්මාතගම මාර්ගයේ කි.මී. 7ක් පමණ ගමන් ගන්නා විට ඓතිහාසික දෙවනගල රජමහ විහාරයට පැමිණිය හැකිය. මෙම ස්ථානයෙන් හමුවන සුප්‍රකටම පුරාවිද්‍යාත්මක සාධකය වනුයේ වංසකථාවේ සඳහන් පළමුවන පරාක්‍රමබාහු රජුගේ බුරුම දේශ ආක්‍රමණය සනාථ වන ගිරි ලිපියයි. මීට අමතරව පළමුවන විමලධර්මසූරිය රාජ්‍ය සමයට අයත් ගිරි ලිපියක් සහ සුවිශේෂ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ගිරිතලයේ සටහන් කළකැටයම් ඵලකයක් ද  දැකිය හැකිය. ගිරිතලයේ සටහන් කළඑම කැටයම් ඵලකය පිළිබඳව උගතුන්ගේ වඩා වැඩි අවධානයක් යොමු වී නොමැති අතර ඒ පිළිබඳව නිසි ශාස්ත්‍රීය පර්යේෂණයක් ද මෙතෙක් සිදුවී නොමැත. එනිසා කැටයම් ඵලකය පිළිබඳව සිදුකළ ශාස්ත්‍රීය අධ්‍යයනයක් සමාජගත කිරීමේ අරමුණ ඇතිව මෙම පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කෙරේ. වර්තමානයේදී නිධන් සොයන්නන්ගේතර්ජනයකට සහ අන්‍ය ආගමිකයන්ගේ දැඩි බලපෑමකට ද දෙවනගල පුරාවිද්‍යා භූමිය නතුව තිබේ. එවැනි පසුබිමක විහාරයේ පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත නිර්මාණයන්හි පුරාවිද්‍යාත්මක අගය පර්යේෂණාත්මකව පෙන්වාදීම ඒවායේ පැවැත්මට මහතසේ දායකවනු ඇත.

දෙවනගල පර්වතය මුදුනේ වූ ගොඩනැගිලිවල සිට මීටර්55ක් පමණ ඔබ්බෙන් කඩුග න්නාව දෙසට මුහුණලා තරමක් පහළ මට්ටමකින් සහ පළමුවන විමලධර්මසූරිය රජුගේ ගිරි ලිපියට තරමක් ඉහළින් එම ගල්තලයේම ආයත චතුරස්‍රාකාරව සලකුණු කොටගත් ඉඩක (මීටර් 3.5×1.5) කැටයම නිර්මාණය කර ඇත. එහි ඉහළින් එකිනෙක තුළ ගිලෙන පරිදි සටහන් කළ සිරිපතුල් සංකේත දෙකක් ද දාගැබ් සංකේත දහ හතරක් ද වෘක්ෂ සංකේත දෙකක් සහ තොරණක සලකුණක් වේ. සංකේත අතර හිඩැස් විවිධ මල් සැරසිලිවලින් අලංකාර කොට ඇත. සියලුම කැටයම් ගල්තලය ගැඹුරට කපා නිර්මාණය නොකොට සිහින් රේඛාවෙන් පමණක් මතු කර තිබේ.

කැටයමින් නිරූපිත සංකේතාර්ථ අධ්‍යයනය කිරීමේදී දෙවනගල විහාරය සහ උඩරට සිතුවම් සම්ප්‍රදාය නියෝජනය කරන දඹුල්ල, හිඳගල, ලේවැල්ල ගංගාරාමය, සුදුහුම්පල විහාරයන්හි සිදුකළ ක්ෂේත්‍ර අධ්‍යයනයකින් ලබාගත් දත්ත මහාවංසය, ධාතුවංසය අදි සාහිත්‍ය මූලාශ්‍රයන්හි අන්තර්ගත තොරතුරු සමග තුලනාත්මකව විමර්ෂණය කරමින් පර්යේෂණාත්මකව සිදුකරන ලදි.

කැටයමින් නිරූපනය වන්නේ සිරිපතුල් ගලක් බව වර්තමානයේ ප්‍රචලිතව පවතින අදහසයි. එහෙත් පර්යේෂණයේදී කැටයම් ඵලකය සොළොස්මස්ථානය දක්වෙන දුර්ලභ ගණයේ නිර්මාණයක් බව අනාවරණය විය. නිර්මාණ ලක්ෂණ හා සෙසු ඓතිහාසික තොරතුරු සැසඳීමේදී කැටයම් ඵලකය උඩරට රාජධානි සමයට අයත් බව නිගමනය කළ හැකිය. සොළොස්මස්ථානය උඩරට විහාර සිතුවම් අතරද බහුලව දැකිය හැකි තේමාවක් හෙයින් තත්කාලීන ජනසමාජයේ සොළොස්මස්ථාන වන්දනය ප්‍රචලිතව පැවති බවට දෙවනගල පර්වතයේ නිර්මිත මෙම කැටයම් ඵලකය ද අගනා සාධකයක් වශයෙන් පෙන්වා දිය හැකිය.

**ප්‍රමුඛ පදඃ** දෙවනගල, ස්තූප, කැටයම්, සිරිපතුල, සොළොස්මස්ථානය

1 ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
damithranagala@gmail.com